පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 222

ආයතනයේ නම : පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම

**பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்** : 222

நிறுவனத்தின் பெயர் : நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம் பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன்கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary series No:222

Name of the institution : Department of Probation and Child Care Services

Submission of observations of Hon.Minister and steps taken with regard to the reports tabled by the committee on public Accounts in terms of Standing Order No. 119(4)

ආයතනයේ නම - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

| කමිටුව විසින් හදුනාගෙන ඇති අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|
| i. <u>අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම.</u><br><br>පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2023 ජූනි 25 දිනට පෙර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර වාර්තා කිරීම | මු.රෙ 133 (ආ) ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ කාර්යයන් ආවරණය වන පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලබයි.<br><br>ඊට අමතරව විගණන හා කළමනාරණ කමිටුවක් පත් කර ඇති අතර 2023 වසරේදී කමිටු රැස්වීම් 2ක්, 2024 වර්ෂයේ කමිටු රැස්වීම් 4 ක් හා මෙම වසරේදී කමිටු රැස්වීම් 02ක් පවත්වා ඇත. |
| ii. <u>UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට නොගැනීම.</u><br><br>උපදේශන ගාස්තුද ඇතුළත්ව රු. 2,350,000 ක පිරිවැයක් දරා එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමට අදාළව එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් කමිටුව වෙත කාලීන හා නිවැරදි වාර්තා ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය සඳහා 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතිය ප්‍රයෝජනයට ගෙන නොතිබීම. | 2023.10.30 දින Open mind Solutions (Pvt) Ltd ආයතනය සමඟ දත්ත පද්ධතිය ස්ථාපනය (Host) කිරීම සඳහා ගිවිසුම්ගතව ඇත.2018 දී පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව වෙත පවරන ලද UNCRC දත්ත පද්ධතියට ළමා අයිතිවාසිකම් සම්මුතිය අනුව ඉදිරිපත් කළ යුතු කාලාන්තර වාර්තාව සකස් කිරීමේදී තොරතුරු ඉදිරිපත් කළ යුතු සියලුම ආයතනවල අදාල නිලධාරීන් වෙත දත්ත ඇතුලත් කිරීම සම්බන්ධයෙන් පුහුණුවීම් ලබා දී ඇත.<br><br>UNCRC දත්ත පද්ධතිය සකස් කිරීමට සැකසූ පරිගණක යෙදුම මගින් දත්ත ඇතුලත් කිරීමේදී ආයතන විසින් මුහුණ දුන් ප්‍රායෝගික හා තාක්ෂණික ගැටළු පිළිබඳ අධ්‍යයනය කර එම පරිගනක යෙදුම සම්බන්ධයෙන් නිර්දේශ හා විසඳුම් ලබා දීමට 2024.08.20 දින කමිටුවක් පත් කරන ලදී. අදාල කමිටුව 2024.10.23 දින රැස් වූ අතර එහිදී UNCRC දත්ත පද්ධතිය සකස් කිරීමට සකස් කර ඇති පරිගණක යෙදුමේ දෝෂ මඟ හරවා ගෙන භාවිතයට සුදුසු පරිදි එය නැවත සකස් කිරීමට කොපමණ මුදලක් වැයවේද එය මූල්‍යමය වශයෙන් ඵලදායීද යන්න විධිමත් අධ්‍යයනයක් ඔස්සේ සිදු කළ යුතු බව හා ඒ සඳහා විශ්ව විද්‍යාලයක පරිගණක ආයතනයක් මඟින් උපදේශන සේවාවක් ලබා ගත යුතු බව කමිටුවේදී තීරණය වී ඇත. නමුත් මේ මේ සඳහාද නැවත වියදමක් දැරීම ඵලදායි ද යන්න ගැටලු සහගත තත්වයක් පවතී. මේ සම්බන්ධයෙන් වර්තමානයේ දී නව රජය යටතේ පිහිටුවා ඇති ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය වෙත තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා ලිපියක් යොමු කර ඇත. (ඇමුණුම 01) මේ සම්බන්ධව 2025.07.03 දින ඩිජිටල් ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශ නිලධාරීන් සමඟ සාකච්ඡාවක් පැවැත්වූ අතර එහිදී දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ නිලධාරීන් වෙත අදාළ දත්ත පද්ධතිය සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීමට අවශ්‍ය නිලධාරීන්ගේ සහයෝගය ලබා දෙන බවට එකඟ විය. ඒ අනුව මේ සම්බන්ධව කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ඩිජිටල් කරණය කිරීමට සමගාමීව UNCRC දත්ත පද්ධතිය භාවිතයට ගත හැකි තත්ත්වයට සංවර්ධනය කිරීමට අවශ්‍යය ඉදිරි කටයුතු සිදු කරන ලෙස දෙපාර්තමේන්තුව විසින් යෝජනා ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| iii. | ළමයින් අනිවාර්යෙන් පාසල් වලට පැමිණීමේ නිර්දේශ ක්‍රියාත්මක වීමට පළාත් මට්ටමින් හා ජාතික මට්ටමින් තොරතුරු ලබා ගැනීම<br><br>• අනිවාර්ය අධ්‍යාපනය ලැබිය යුතු ළමුන්ගේ පාසල් නොපැමිණීම පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් යාවත්කාලීනව දත්ත පවත්වාගෙන ඒ පිළිබඳ කටයුතු කළ යුතු බවද පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් ළමා අධ්‍යාපනය තහවුරු කිරීම පිළිබඳව ජාතික ප්‍රතිපත්ති සකස් කළ යුතු බවද කාරක සභාව අනුමත කළේය. | I. අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අංක 1963/30 අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව සෑම පාසලකම පාසල් අධීක්ෂණ කමිටු පිහිටුවීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් අතුරින් ප්‍රාදේශීය ලේකම්වරයා නියෝජනය කරනු ලබන ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු කමිටුවට ඇතුලත් කර ඇත. ප්‍රාදේශීය ලේකම් නම් කරනු ලබන නිලධාරියා ලෙස ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර නම් කරන ලෙස දන්වා ලිපි ප්‍රාදේශීය ලේකම්වරුන්ට යොමු කර ඇත. එම ගැසට් නිවේදනය සඳහා මෙම නිලධාරීන්ගේ තනතුර ඇතුලත් කිරීමට සාකච්ඡා කළ නමුදු ඒ සඳහා දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු බව අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රකාශ කරන ලදී. පාසල් නොයන ළමුන් පාසල්ගත කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ ඍජු වගකීමක් බව 2023.09.19 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවති රැස්වීමේදී ප්‍රකාශ කරන ලදී. එම රැස්වීම පදනම් කරගනිමින් ලිපියක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2023.10.02 දින නිකුත් කර ඇත. ඊට අනුව ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර විසින් පාසල් නොයන බවට හඳුනාගත් දරුවන් පාසල් අධීක්ෂණ කමිටු වෙත යොමු කළ යුතු වේ. ඔවුන් විසින් එම දරුවන් පාසල්ගත කිරීමත්, අනතුරුව තොරතුරු ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී/සහකාර වෙත ලබා දීමත් සිදු කළ යුතු වේ. එලෙස දැනුම් දුන් දරුවන් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.<br><br>II. එහිදී අධ්‍යාපන අමාත්‍යාංශයේ උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය විසින් දරුවන්ගේ ගැටලුවක් වාර්තා වූ පසු එය ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කළ යුත්තේ කවුරුන් වෙතද යන්න නිශ්චිතව දැන ගැනීමට මාර්ගෝපදේශයක් සකස් කිරීමට අදාල කටයුතු මේ වන විට සිදුකරමින් පවතින බව දක්වන ලදී. |
| iv. | <u>නීති නිලධාරී තනතුරට පූර්ණ කාලීන නිලධාරියෙකු පත්කර ගැනීම</u>. | පුරප්පාඩු පිරවීමට අදාළ ගැසට් පත්‍රය 2025.06.27 දින පළ කර ඇති අතර එම නිවේදනය අනුව අයදුම්පත් ලැබිය යුතු අවසාන දිනය 2025.07.27 වේ. සම්මුඛ පරීක්ෂණ මණ්ඩල කමිටු පත් කිරීම මේ වන විට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට යොමු කර ඇත.(ඇමුණුම 2) |
| v. | ළමුන් සම්බන්ධ ගැටලු/පැමිණිලි පැමිණිලි වලට විසඳුම් ලබා දීමට මෙහෙයුම් කමිටු ක්‍රියාත්මක කිරීමේ ක්‍රම වේදය සකස් කිරීම | • පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු යටතේ පරිවාස නිලධාරීන් සේවය කරන අතර ඔවුන්ගේ නිත්‍ය සේවා ස්ථානය පරිවාස කාර්යාල වේ. එහෙත් දරුවන් සම්බන්ධ ගැටළු සාකච්ඡා කෙරෙන කමිටු ව්‍යුහය වන ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රාදේශීය, දිස්ත්‍රික් |

| | | |
|---|---|---|
| | | හා පළාත් කමිටු සඳහා මෙම නිලධාරීන්ගේ සහභාගීත්වය හා දායකත්වය ලබා ගනු ලැබේ.<br>• අනාරක්ෂිත හා අවදානම් සහගත දරුවන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හඳුනා ගැනීමට ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන්/ළමා හිමිකම් ප්‍රවර්ධන සහකාර විසින් විවිධ ක්‍රමවේද ඔස්සේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ළමා හා කාන්තා ඒකකයේ සියලු නිලධාරීන්ගේ ඒකාබද්ධ ප්‍රවේශ තුළින් කටයුතු කරනු ලබයි.<br><br>ළමුන් සම්බන්ධ ගැටළු වාර්තාවීම් ජාතික පද්ධතියක් ලෙස පවත්වාගෙන යාම ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ විෂය පථයට අයත් වේ. |
| **vi.** | <u>ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ආයතනික දත්ත පද්ධතිය සැකසීම</u> | අංක PCC/2/2/10 හා 2023.11.13 දිනැති ලිපිය මගින් දත්ත පද්ධතිය සම්බන්ධ වාර්තාව රාජ්‍ය ගිණුම් කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.<br><br>වර්තමාන ප්‍රගතිය සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය වෙතින් ලද වාර්තාව. (ඇමුණුම 03) |
| **vii.** | ළමුන් සම්බන්ධ කුලවද්දා ගැනීමේ ආඥා පනත ඇතුළු නීති සහ අණපනත් කාලීන අවශ්‍යතාවයට ගැලපෙන ලෙස සංශෝධන කටයුතු කඩිනම් කිරීම | ළමයින් හා යොවනයන් පිළිබ ආඥා පනත කෙටුම්පත් කිරීම අවසන් කර කමිටුව මගින් අධිකරණ අමාත්‍යාංශයට අවසන් කෙටුම්පත ලබා දී ඇත. මෙම පනත් සංශෝධනයන් අධිකරණ අමාත්‍යාංශය මගින් සිදු කරනු ලබන අතර ඒ සඳහා දෙපාර්ත්මේන්තුව එක් කමිටු සාමාජිකයෙකු ලෙස පමණක් සහභාගී වේ.<br><br>කෙසේ වෙතත් ළමා පනත සංශෝධනය කිරීමට අදාල කමිටුව මගින් අවසන් කොට අදාළ කෙටුම්පත මේ වන විට අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සඳහා භාර දී ඇත.එහෙත් ළමුන් හදා වඩා ගැනීමේ ආඥා පනත සංශෝධනයට අදාළ කටයුතු අවසන් වී නොමැත. එබැවින් මේ සම්බන්ධ කටයුතු කඩිනම් කරන මෙන් අධිකරණ අමාත්‍යාංශයෙන් ද ඉල්ලීමක් කර ඇත. ළමා පනත හා ළමුන් හදාවඩා ගැනීමේ ආඥා පනත ගැසට් කර ඇත්තේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය යටතේ වන අතර පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව අදාළ පනත් කෙටුම්පත් කිරීමේදී තාක්ෂණික දායකත්වය ලබා දීම පමණක් සිදු කරනු ලැබේ. |
| | 02.පරත්ත ළමා පුහුණු හා උපදේශන සේවා ජාතික මධ්‍යස්ථානය පවත්වාගෙන යාම | ADB ආධාර යටතේ බස්නාහිර පළාත් සභාව මගින් පරත්ත ළමා සංවර්ධන මධ්‍යස්ථානයේ කාන්තා නේවාසිකාගාරය අලුත් වැඩියා කරන ලද නමුත් ගෙවීම් සම්බන්ධ ගැටලුවක් නිසා එම කාර්යයන් අතර මග නැවතී ඇත. අදාළ ගැටලුව විසදගත් වහාම ඉතිරි වැඩ සම්පූර්ණ කිරීම සිදු කළ හැක. කෙසේ නමුත් මෙම අලුත් වැඩියාව සිදු කළ ද සමස්ත ගොඩනැගිල්ලම අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බැවින් ළමයින් රඳවා ගැනීමට නුසුදුසු තත්ත්වයේ පවතී.<br><br>ඒ අනුව පරත්ත පුහුණු හා උපදේශන මධ්‍යස්ථානය සම්පූර්ණයෙන් අලුත්වැඩියා කර ළමුන් රඳවා ගත හැකි තත්ත්වයට පත් කිරීමට අදාළ ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇති අතර ප්‍රතිපාදන ලැබුණු පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය. |

| | |
|---|---|
| 03. පළාත් මෙහෙයුම් කමිටු පැවැත්වීම | 2023 ජූලි 04 පැවති රජයේ ගිණුම් කාරක සභා නියෝග පරිදි 2023 වර්ෂයේදී පළාත් හා දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු පවත්වා ඇති අතර 2024 වර්ෂයේදී විධිමත් පරිදි කමිටු පැවැත්වීම සඳහා උපදෙස් ලබා දුන් අතර කමිටු පැවැත්වීම පිළිබඳ වාර්තාව ඇමුණුම 04 මගින් ඉදිරිපත් කර ඇත.<br><br>මෙම කමිටු පැවැත්වීමට අදාල න්‍යාය පත්‍රයක් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2018.01.10 දිනැතිව අංක 01/18 චක්‍රලේඛය මගින් හඳුන්වාදී තිබේ. ඒ අනුව පළාත් කමිටු රැස්වීම් පැවැත්වේ.<br><br>ළමා අයිතිවාසිකම් පිළිබඳ මෙහෙයුම් කමිටු ග්‍රාමීය, ප්‍රාදේශීය, දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමින් ක්‍රියාත්මක වේ. ග්‍රාමීය කමිටු මගින් ළමුන් සම්බන්ධ ගැටළු හඳුනා ගත්විට එම කමිටු මට්ටමින් මැදිහත්විය හැකි ගැටළු විසඳීමත් විසඳීමට අපහසු ගැටළු ප්‍රාදේශීය කමිටුවට යොමු කර විසඳුම් ලබා ගැනීමත් සිදු වේ. ප්‍රාදේශීය මට්ටමින් නොවිසඳුනු ගැටළු දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටම දක්වා ඉදිරිපත් කිරීම සිදු වේ. |

.......................................

සරෝජා සාවිත්‍රි පෝල්රාජ්

ගරු අමාත්‍ය

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය

**සරෝජා සාවිත්‍රි පෝල්රාජ්**
ගරු කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය
කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය
06 වන මහල, සෙත්සිරිපාය දෙවන අදියර,
බත්තරමුල්ල.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம்
**DEPARTMENT OF PROBATION AND CHILD CARE SERVICES**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
பெண்கள் மற்றும் சிறுவர் விவகாரங்கள் அமைச்சு
Ministry of Women and Child Affairs

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது.இல / My Number: PCC/03/04/01- CRC | ඔබේ අංකය / உமது.இல / Your Number: | දිනය / திகதி / Date: 2025.03.12 |

අධ්‍යක්ෂ ( සංවර්ධන )
ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
One Galle Face Tower
නො. 1 ඒ, සෙන්ටර් පාර
ගාලු මුවදොර
කොළඹ 02

**<u>පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන UNCRC දත්ත පද්ධතියේ යාවත්කාලීන කිරීම සහ තාක්ෂණික සහය ලබාගැනීම</u>**

1991 වසරේ ශ්‍රී ලංකාව , එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියට අත්සන් කිරීමත් සමග එහි ක්‍රියාත්මකභාවය පිලිබදව කාලින වාර්තාවක් වසර 5 කට වරක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ළමා ආරක්ෂක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.ඉහත සදහන් වාර්තාව සැකසීම සදහා ළමුන් වෙනුවෙන් ඍජුව සහ වක්‍රව කටයුතු කරන අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු සහ ආයතන කිහිපයක සහයෝගය ඇතිව දත්ත රැස් කිරීමේ ක්‍රම වේදයක් ලෙස UNCRC දත්ත පද්ධතිය 2018 වර්ෂයේදී පෞද්ගලික ආයතනයක් වෙතින් සංවර්ධන කර ඇත.

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව පදනම්ව ක්‍රියාත්මක වන මෙම UNCRC දත්ත පද්ධතිය ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් පිලිබදව කාලීන වාර්තාව සකස් කිරීමේ වැදගත් කාර්යන් ඉටු කරනු ලැබිය හැක.

නමුත් දැනට පවතින UNCRC දත්ත පද්ධතියේ ඇතැම් තාක්ෂණික අඩුපාඩු නිසා පද්ධතියේ ගුණාත්මකභාවය අඩු වී දැනට එය භාවිතා නොකරන තත්ත්වයේ පවතින බැවින්, එය නවීන තාක්ෂණය සමඟ යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය මතුවී ඇත.

එසේම මෙම තොරතුරු පද්ධතිය සංවර්ධනය කළ පෞද්ගලික ආයතනය සමග අත්සන් කල ගිවිසුම් කාලය කල් ඉකුත්ව ඇති බැවින් , මෙම පද්ධතිය නවීකරණය කර, වඩාත්ම සුරක්ෂිත සහ කාර්යක්ෂම පද්ධතියක් ලෙස ඉදිරියට ගෙන යාම සඳහා ඔබගේ අමාත්‍යාංශය මගින් අපට අවශ්‍ය තාක්ෂණික සහාය ලබාදීමට කාරුණිකව ඉල්ලා සිටිමු.

අවශ්‍ය ප්‍රධාන යාවත්කාලීන අවශ්‍යතා:

1. **දත්ත ආරක්ෂාව වැඩිදියුණු කිරීම** - ළමුන් සම්බන්ධ වැඩසටහන් වල දත්ත ගබඩා කිරීම හා බෙදාහැරීමේ ආරක්ෂාව වඩාත් ශක්තිමත් කිරීම.

කාර්යාලය, 03 වන මහල , සෙත්සිරිපාය IIවන අදියර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
அலுவலகம், 03ம் மாடி,ஐஐம் தொகுதி,செத்சிரிபாய,பத்தரமுல்லை, இலங்கை.
Office, 03rd Floor, Sethsiripaya Stage II,Battaramulla, Sri Lanka
විද්‍යුත් තැපැල/மின்னஞ்சல் /E-mail: pcc@sltnet.lk
වෙබ්/இணையம்/ Web : www.probation.gov.lk
කාර්යාලය/காரியாலயம் /Office :0112186062
ෆැක්ස්/ தொலைநகல்/Fax : 011 2187285/ 011 2186065

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
நன்னடத்தை மற்றும் சிறுவர் பராமரிப்பு சேவைகள் திணைக்களம்
# DEPARTMENT OF PROBATION AND CHILD CARE SERVICES

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය
பெண்கள் மற்றும் சிறுவர் விவகாரங்கள் அமைச்சு
Ministry of Women and Child Affairs

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது.இல<br>My Number | PCC/01/02/19(1) | ඔබේ අංකය<br>உமது.இல<br>Your Number | | දිනය<br>திகதி<br>Date | 2025.08.13 |

**ලේකම්,**
**කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීමේ අමාත්‍යාංශය මඟින්**

**ලේකම්**
**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**<u>නීති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය නම් කර ගැනීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් PSC/APP/8/5/92/2019 හා 2025.04.25ලිපිය හා බැඳේ.

02 ඒ අනුව පවතින නීති නිලධාරී (SL-1) තනතුර (01) සඳහා බඳවා ගැනීමේ නිවේදනය 2025.06.27 දින රජයේ ගැසට්පත්‍රයේ පළ ලද අතර අදාල ගැසට් නිවේදනයේ පිටපතක් මේ සමග කාරුණිකව ඉදිරිපත් කරමි.

03.බඳවා ගැනීමේ සුදුසුකම් පරීක්ෂා කිරීමට අදාලව යෝජිත පහත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීම සඳහා අනුමැතිය ලබාදෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

| | නම හා තනතුර | අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තනතුර |
|---|---|---|---|
| 01 | එන්.එච්.එම්.ඩබ්.ඩබ්.නිල්මිණි හේරත් මිය<br>අතිරේක ලේකම් (සංවර්ධන) | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | සභාපති |
| 02 | ගයනි කෞශල්‍යා විජේසිංහ මිය<br>කොමසාරිස් | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | සාමාජික |
| 03 | රෝෂිණී හෙට්ටිගේ මිය<br>(ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්) | අධිකරණ,බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | සාමාජික |
| 04 | එන්.ළමාහේවා මිය<br>සහකාර අධ්‍යක්ෂ(ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවා,වාස්තු විද්‍යාඥ සේවා තාක්ෂණ සේවා) | රාජ්‍ය පරිපාලන පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | සාමාජික |
| 04 | එම්.කේ.පෙරේරා මිය<br>නීති නිලධාරී | කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය | සාමාජික |

ගයනි කෞශල්‍යා විජේසිංහ
කොමසාරිස්

බී කොටස, 03 වන මහල , සෙත්සිරිපාය IIවන අදියර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"பீ"பிரிவு,03ம் மாடி,ஐஐம் தொகுதி,செத்சிரிபாய,பத்தரமுல்லை, இலங்கை.
**WingB, 03rd Floor, Sethsiripaya Stage II,Battaramulla, Sri Lanka**

විද්‍යුත් තැපැල/மின்னஞ்சல் /**E-mail: pcc@sltnet.lk**
වෙබ්/இணையம்/ **Web : www.probation.gov.lk**
කාර්යාලය/காரியாலயம் /**Office :**0112186062
ෆැක්ස්/ தொலைநகல்/**Fax :** 011 **2187285/ 011 2186065**

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
தேசிய சிறுவர் பாதுகாப்பு அதிகாரசபை
National Child Protection Authority

දුරකථන / தொ. பே. இல. / Telephone: 011-2778911, 011-2778912, 011-2778913, 011-2778914
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2778915

නො. 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර.
இல. 330, தலவத்துகொட வீதி, மாதிவெல, ஸ்ரீ ஜயவர்தனபுர.
No. 330, Thalawathugoda Rd., Madiwela, Sri Jayawardenepura.

වි. තැපෑල / மின்னஞ்சல் / E-mail: ncpa@childprotection.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web Site: www.childprotection.gov.lk

NCPA/IA/MWCA/2025/05/12

2025.08.13

කොමසාරිස්,
පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව,
03 වන මහල,
සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල.

**<u>2023 ජුලි මස 04 වැනි දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා රැස්වීමේදී ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්ත්වය හා වර්තමාන කාර්ය සාධනය</u>**

ඉහත උදෘතයෙන් කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමිය විසින් ජාතික ළමා ආරක්ෂක අධිකාරියට පිටපතක් සහිතව යොමු කළ අංක MWCA/03/4/COPA දරණ 2025.08.04 දිනැති ලිපිය හා බැඳේ.

එම ලිපිය මඟින් ඉල්ලුම් කර ඇති ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ජාතික දත්ත පද්ධතිය සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය පහත පරිදි කාරුණිකව ඉදිරිපත් කරමි.

<u>(vi) ජාතික දත්ත පද්ධතිය සකස් කිරීමේ වර්තමාන ප්‍රගතිය</u>

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දැනට පවත්වා ගෙන යනු ලබන අභ්‍යන්තර දත්ත පද්ධතිය, ජාතික දත්ත පද්ධතියක් දක්වා වැඩි දියුණු කිරීම වෙනුවෙන් අවශ්‍ය සහය ලබා දෙන ලෙස තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ ආයතනය (ICTA) වෙතින් ඉල්ලීම් කළ ද ඉදිරි කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය වෙතින් මේ සඳහා අවශ්‍ය සහය ඉල්ලා සිටින ලදී.

ඒ අනුව ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ සහයෝගය මත කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සඳහා පොදු දත්ත පද්ධතියක් සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ළමා අපයෝජන සම්බන්ධයෙන් ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ දැනට පවත්වා ගෙන යනු ලබන අභ්‍යන්තර දත්ත පද්ධතිය වැඩිදියුණු කරමින් ජාතික දත්ත පද්ධතිය සකස් කිරීම සඳහා අවශ්‍ය සැලසුම් මේ වන විට සකස් කර ඇත. මෙ සම්බන්ධයෙන් මූලික අදියරේ සාකච්ඡා පවත්වා ඇති අතර ජාතික දත්ත පද්ධතිය සකස් කිරීම හා දත්ත ඇතුළත් කිරීම සඳහා අදාළ වන ආයතන සම්බන්ධීකරණය කිරීම ඇතුළු ඉදිරි කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

ප්‍රීති ඉනෝකා රණසිංහ
සභාපති
ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## ළමා අයිතිවාසිකම් පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු පැවැත්වීම - 2024

| අනු අංකය | දිස්ත්‍රික්කය | පළමු කාර්තු රැස්වීම පැවැත්වූ දින | දෙවන කාර්තු රැස්වීම පැවැත්වූ දින | තෙවන කාර්තු රැස්වීම පැවැත්වූ දින | සිව්වන කාර්තු රැස්වීම පැවැත්වූ දින |
|---|---|---|---|---|---|
| 1 | කොළඹ | 2024.03.19 | 2024.06.18 | - | 2024.12.19 |
| 2 | ගම්පහ | 2024.04.09 | 2024.07.03 | 2024.11.20 | 2024.12.24 |
| 3 | කළුතර | 2024.03.19 | 2024.06.27 | 2024.10.24 | 2024.12.19 |
| 4 | ගාල්ල | 2024.03.20 | 2024.06.19 | 2024.10.16 | 2024.12.27 |
| 5 | මාතර | 2024.04.02 | 2024.07.16 | 2024.10.23 | 2024.12.17 |
| 6 | හම්බන්තොට | 2024.04.04 | 2024.07.16 | 2024.10.25 | 2024.12.27 |
| 7 | මහනුවර | 2024.03.26 | 2024.06.27 | 2024.10.25 | |
| 8 | මාතලේ | 2024.04.03 | 2024.07.16 | 2024.10.15 | 2024.12.19 |
| 9 | නුවරඑළිය | 2024.04.05 | 2024.07.23 | - | - |
| 10 | කුරුණෑගල | 2024.03.22 | 2024.06.28 | 2024.11.25 | 2024.12.23 |
| 11 | පුත්තලම | 2024.02.21 | 2024.05.21 | 2024.08.21 | 2024.11.20 |
| 12 | රත්නපුර | 2024.03.05 | 2024.06.13 | 2024.10.24 | 2024.12.24 |
| 13 | කෑගල්ල | 2024.03.05 | 2024.06.13 | | 2024.11.20 |
| 14 | අනුරාධපුර | 2024.04.05 | 2024.07.29 | | 2024.12.17 |
| 15 | පොළොන්නරුව | 2024.03.28 | 2024.07.02 | 2024.10.03 | 2024.12.24 |
| 16 | බදුල්ල | 2024.03.27 | 2024.07.02 | - | 2024.12.18 |
| 17 | මොනරාගල | 2024.03.19 | 2024.06.13 | | 2024.12.05 |
| 18 | යාපනය | 2024.03.01 | 2024.08.22 | 2024.11.08 | 2024.12.11 |
| 19 | වව්නියාව | 2024.04.24 | - | 2024.11.20 | - |
| 20 | මන්නාරම | 2024.02.20 | 2024.07.10 | 2024.10.10 | 2024.12.30 |
| 21 | මුලතිව් | 2024.03.26 | 2024.07.31 | | |
| 22 | කිළිනොච්චි | 2024.03.20 | 2024.08.06 | - | 2024.12.04 |
| 23 | අම්පාර | 2024.05.02 | 2024.09.03 | 2024.12.03 | 2024.12.30 |
| 24 | ත්‍රිකුණාමලය | 2.24.03.26 | 2024.07.25 | 2024.10.24 | 2024.12.19 |
| 25 | මඩකලපුව | 2024.03.22 | 2024.06.20 | - | 2024.12.30 |